කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010

2012 ජනවාරි / පෙබරවාරි

සමාජීය විද්‍යා පීඨය

පුස්තකාල හා විඥාපන විද්‍යාව - LISC - E 2015

ග්‍රන්ථ විඥාපන පාලනය, සුචිකරණ න්‍යාය හා පරිචය

පළමුවන ප්‍රශ්නය ඇතුළුව මුළු ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

---

01. **අනිවාර්ය ප්‍රශ්නය**

පහත දැක්වෙන ග්‍රන්ථ විස්තරය අනුව වර්ගීකෘත සුචියකට අවශ්‍ය සියලුම සංලේඛ පිළියෙල කරන්න. (ලකුණු 20)

අධ්‍යාත්මික විශ්වාසය හා ජීවිතය/ ප්‍රායෝගික මනෝ විද්‍යාව/ ආගමික විශ්වාසය වර්ධනය කර ගැනීමෙන් ජීවිතය සාර්ථක කර ගන්නා අන්දම කියාදෙන විශ්ව සම්භාවනීය කෘතිය/ සුප්‍රකට මනෝ - ආගමික චිකිත්සක ආචාර්ය නෝර්මන් වින්සට්න් පීල් ගේ "A Guide to Confident Living" නම් කෘතියේ සිංහල පරිවර්තනය/ පරිවර්තනය ලීලානන්ද ගමාච්චි/ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය/ මුල්ලේරියාව/ 2002/ ISBN 955- 652-031-8/ පිටු XXX III, 343/ රු.400/ වර්ග අංකය 158

02. i. පුස්තකාල සුචිය යන්න විවිධ නිර්වචන ඇසුරින් හඳුන්වන්න. (ලකුණු 07)

ii. තත් කාලීන තාක්ෂණික හා පාඨක අවශ්‍යතාවන්ට අනුව පුස්තකාල සුචියේ අරමුණු ක්‍රමික විකාශනයකට පත්වූ ආකාරය විවිධ පුද්ගලයන් හා ආයතන විවිධ කාලවලදී දක්වන ලද සුචිකරණ අරමුණු ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 13)

03. i. ග්‍රන්ථ විඥාපන පාලනය සැකවින් හඳුන්වන්න. (ලකුණු 05)

ii. ප්‍රකාශන සුලබතාවය සැකවින් හඳුන්වන්න. (ලකුණු 05)

iii. සමස්ත ලෝකවාසී මානව දැනුම හා තොරතුරු වාර්තාගත කිරීමට, ප්‍රචාරණයට හා අනාගත පරපුරට ආරක්ෂා කිරීමට ග්‍රන්ථ විඥාපන පාලනය හා ප්‍රකාශන සුලභතාව යන සංකල්ප දෙකෙන් ලැබෙන දායකත්වය විස්තර කරන්න. (ලකුණු 10)

04. i. පාඨක තොරතුරු ප්‍රවේශන මාර්ග මොනවාද? හඳුන්වන්න. (ලකුණු 06)

ii. පත්‍රිකා සූචියක දී හා පරිගණක සූචියක දී ඉහත සඳහන් විවිධ පාඨක ප්‍රවේශන මාර්ග සංතෘප්ත කිරීමට කටයුතු කෙරෙන ආකාරය උදාහරණ දෙමින් සංසන්දනාත්මකව විස්තර කරන්න. (ලකුණු 14)

05. ඇංග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ දෙවැනි සංස්කරණයේ ව්‍යුහය හා විශේෂතා උදාහරණ දෙමින් විස්තර කරන්න.

(ලකුණු 20)

06. පත්‍රිකා හෝ පරිගණක සූචි පරිසරයක දී විෂය ශීර්ෂ පාඨකරණයේ දී සියර්ස් **හෝ** කොංග්‍රස් පුස්තකාල විෂය ශීර්ෂ ලැයිස්තුවලින් ලැබෙන පිටිවහල විස්තර කරන්න.

(ලකුණු 20)

07. පහත මාතෘකා අතරින් **පහක් (05)** සඳහා කෙටි සටහන් ලියන්න.

i. OPAC
ii. අන්තර් නිර්දේශ
iii. මිශ්‍ර කර්තෘ
iv. වර්ගීකෘත සූචියක් සඳහා වූ නීති සංග්‍රහය
v. ISBD
vi. ග්‍රන්ථ නාම යටතේ ශීර්ෂපාඨ කරණය

******************************